රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: **(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** / Web Site

---

මගේ අංකය / எனது இல / My No: CS/DOS/අන්තර්ග්‍රහණය
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.07.20

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/
දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ගේ ශ්‍රේණිගත උසස් කිරීම්</u>**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2012(III)හි විධිවිධාන අනුව 2011.08.01 දිනට මධ්‍යම රජයේ MN4-2006(A) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන උපාධිධාරී තනතුරක සේවයේ යෙදී සිටි නිලධාරීන් සහ MN4-2006(A) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන උපාධිධාරී තනතුරක 2011.08.01 දිනට පළාත් රාජ්‍ය සේවයේ නිරතව සිටි හා පසුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2010(i) අනුව මධ්‍යම රජයේ සංවර්ධන නිලධාරී තනතුරකට ස්ථාන මාරු වී පැමිණ සේවයේ නිරතව සිටි නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ 14වන ඡේදය ප්‍රකාරව සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු අවසන් වෙමින් පවතී.

02. ඒ අනුව, සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබූ/ලබන නිලධාරීන් නියමිත සුදුසුකම් සපුරා තිබේ නම් පිළිවෙලින් සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට හා I ශ්‍රේණියටත්, II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන් නියමිත සුදුසුකම් සපුරා තිබේ නම් I ශ්‍රේණියටත් උසස් කිරීමට කටයුතු කළ යුතුව ඇත. මේ සඳහා අමුණා ඇති ආදර්ශ අයදුම්පත (CS/DOS/PRO/APP) ප්‍රකාරව අයදුම් කරන ලෙස ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/කාර්යාලයට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් එහිදී ලැබෙන අයදුම්පත්‍ර ඔබගේ නිර්දේශ සහිතව නිලධාරියාගේ/නිලධාරිණියගේ යාවත්කාලීන කරන ලද චර්යා සටහනෙහි සහතික කළ පිටපතක්ද සමඟ මා වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුවේ. අන්තර්ග්‍රහණ ලිපිය ලැබී නොමැති වුවද එම නිලධාරීන් අන්තර්ග්‍රහණය කරනු ලබන අවස්ථාවේදීම, උසස් කිරීම සම්බන්ධව කටයුතු කිරීමේ හැකියාව පවතින බැවින් උසස් කිරීම සඳහා අයදුම් කිරීමට නිලධාරීන්ට අවස්ථාව සලසන ලෙසද ඔබ වෙත දන්වමි. එහිදී 2011.08.01 දිනට සංවර්ධන නිලධාරී සේවයේ III/II ශ්‍රේණියේ වසර 10ට වැඩියෙන් ගත කර ඇති සක්‍රීය හා සතුටුදායක සේවා කාලය එම නිලධාරීන්ගේ II/I ශ්‍රේණියට උසස් කිරීමේදී ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 05/2018 විධිවිධාන අනුව සලකා බලන බව තවදුරටත් දන්වා සිටිමි.

03. ශ්‍රේණිගත උසස් කිරීම් සඳහා සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ 12 වගන්තිය ප්‍රකාරව සුදුසුකම් සපුරාලිය යුතු වුවද ඉහත 02 ඡේදයේ සඳහන් III/ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත දක්වා ඇති පරිදි සමත් වී තිබීම උසස් කිරීම සඳහා අවශ්‍ය වේ.

- සේවා ව්‍යවස්ථාවේ සඳහන් අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට පෙර සමත්වී තිබීම.

- අන්තර්ග්‍රහණය කරන ලද 2011.08.01 දිනට පෙර, එම නිලධාරීන් දරන ලද තනතුර සඳහා වන අනුමත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් පළමු හා/හෝ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වී තිබීම. (සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ 17.1 වගන්තිය අනුව සංවර්ධන නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.)

04. ඉහත දක්වා ඇති අවස්ථාවන්ට පරිබාහිරව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර ඇති නිලධාරීන් වේනම් ඔහු/ඇය විසින් නියමිත පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවීම මත අදාල උසස්වීම ලබා දීම සම්බන්ධව ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශ අයදුම්පතෙහි ඇතුළත් කිරීම අනිවාර්ය වන අතර එවැනි නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමට අදාලව සහන සැලසීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් විමසා කටයුතු කරනු ලැබේ.

05. 2007.07.01 දිනට පසු රාජ්‍ය සේවය සඳහා බඳවා ගන්නා ලද නිලධාරීන්, රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර තිබීම උසස්වීම සඳහා අවශ්‍යතාවයක් ලෙස දක්වා තිබුනද, රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම හැර අනෙකුත් සුදුසුකම් සියල්ල සම්පූර්ණ කර තිබේනම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014(VIII) විධිවිධාන අනුව ඔවුන්ටද සංවර්ධන නිලධාරී සේවයේ උසස්වීම් සඳහා ඉල්ලුම් කළ හැකි බව වැඩිදුරටත් දන්වා සිටිමි.

**එස්. ආලෝකබණ්ඩාර**

**ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්**

ඇමුණුම 01

CS/DOS/Pro/App

**සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරින් II/I ශ්‍රේණියට සාමාන්‍ය කාර්යය සාධනය මත උසස් කිරීම සඳහා වූ ආදර්ශ අයදුම් පත්‍රය**

1. මුලකුරු සමග නම :
   හිමි/මයා/මිය/මෙය
2. මුලකුරු වලින් හැඳින්වෙන නම් :
3. උපන් දිනය :
4. ජාතික හැඳුනුම්පත් අංකය :
5. සංවර්ධන නිලධාරි සේවයට පත් කිරීමේ/අන්තර්ග්‍රහණ ලිපියේ අංකය :
6. මුල්පත්වීම් දිනය :
7. පත්වීම ස්ථිර කල දිනය :
8. II ශ්‍රේණියට උසස් කළ දිනය (අදාල නම්) :
9. ....... කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය හා විභාග අංකය :
10. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කළ දිනය :
11. ...... ශ්‍රේණියේ වසර දහයක සේවා කාලය සම්පූර්ණ කල දිනය :
12. දැනට සේවය කරන කාර්යාලය : අමාත්‍යාංශය:
    දෙපාර්තමේන්තුව:
    කාර්යාලය:

............................................................දින සිට සංවර්ධන නිලධාරි සේවයේ ........... වන ශ්‍රේණියට උසස් කරන මෙන් ඉල්ලා සිටිමි.

දිනය:.................................................... ...........................................

අයදුම්කරුගේ අත්සන

---

මගේ අංකය :-

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,

.............................................................................................................. හිමි/මයා/මිය/මෙය

මෙම කාර්යාලයේ සේවය කරන අතර

I. .......................................දිනට ............... ශ්‍රේණියේ වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ ඇති බවත්,
II. ............... ශ්‍රේණියට නියමිත වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබෙන බවත්,
III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබෙන බවත්,
IV. එම වසර දහය (10) තුළ අඩ වැටුප් සහ වැටුප් රහිත නිවාඩු දින .........................ක් ලබා ඇති බවත් /අඩ වැටුප් සහ වැටුප් රහිත නිවාඩු ලබා නොමැති බවත්,
V. එම කාලය තුළ කිසිම දඩුවමකට (අවවාද කිරීමක් හැර) යටත් කර නොමැති බවත්,
VI. නිලධාරියාට / නිලධාරිණියට විරුද්ධව විනය කටයුතු කිසිවක් නොමැති බවත් / ඉදිරියේ දී විනය ක්‍රියාමාර්ග ගැනීමට දැනට අදහස් නොකරන බවත්,
VII. ................ වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ................දින සමත්වී ඇති බවත්,

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පිළිබඳ විස්තර

| කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා ඇති දින | නිලධාරියා සහභාගී වී ඇති/නැති බව | සමත්/අසමත් බව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

| |
|---|
| සහන ලබා දී ඇත්නම් ඒ පිළිබඳ විස්තර<br>.................................................................................................................................................................<br>................................................................................................................................................................. |
| නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග<br>.................................................................................................................................................................<br>................................................................................................................................................................. |
| නියමිත පරිදි කාර්යක්ෂමතා පරීක්ෂණය සමත් නොවීම මත අදාළ උසස්වීම් ලබා දීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියාගේ නිරීක්ෂණ හා නිර්දේශ<br>.................................................................................................................................................................<br>................................................................................................................................................................. |
| • **කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාල සියලු ලිපි ලේඛනවල සහතික කරන ලද අමුණා එවිය යුතුය.** |

VIII. ..................................................දින සිට පත්වීම් ස්ථිර කර ඇති බවත්

IX. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සමත්වීමේ අවශ්‍යතාවය අදාල නොවන බවත් / සම්පූර්ණ කර ඇති බවත්/ සම්පූර්ණ කර නොමැති බවත්, (අදාල ලිපි ලේඛනවල සහතික කළ පිටපත් මඟින් තහවුරු කළ යුතුය.)

X. ............. ශ්‍රේණියට උසස් කිරීමට සුදුසුකම් සපුරාලන ............... දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත්, සඳහන් කරමි.

මෙම නිලධාරියා /නිලධාරිණිය .......................දින සිට සංවර්ධන නිලධාරි සේවයේ II/I ශ්‍රේණියට උසස් කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බැවින් එදින සිට සංවර්ධන නිලධාරී සේවයේ ........ ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන :
නම :
පදවි නාමය :
දිනය:................................................. (නිල මුද්‍රාව තබන්න)

**සටහන :-**

1. **ඉහත අංක I සිට X දක්වා සුදුසුකම් සපුරා නොමැති නම් ඒවා සඳහන් කර එවිය යුතුයි.**
2. **සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට හා I ශ්‍රේණියට උසස් කිරීම් සඳහා මෙම ආකෘති පත්‍රය 2020.08.01 දින සිට භාවිතා කළ යුතු අතර ආකෘතියේ අදාළ නොවන කොටස් කපා ඉදිරිපත් කළ යුතුය.**
3. **නිලධාරියාගේ/නිලධාරිණියගේ යාවත්කාලීන කරන ලද චර්යා සටහනේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.**